**හපුතලේ ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුනි 04 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට හපුතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයට අදාල රු.236,486 ක උසාවි දඩ ආදායම ඉකුත් වර්ෂයට අදාල හිඟ හිටි ආදායමක් ලෙස ගිණුම් තැබීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.236,486 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවෙන් 2010 නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාලව ලැබුණු රු.67,545 ක සහ ඌව පළාත් සභාවෙන් 2013 නොවැම්බර් මාසයට අදාලව ලැබුණු රු.340,955 ක මුද්දර ගාස්තු ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස සලකා ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.408,500 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 05 කට අදාලව ගෙවිය යුතු තැන්පතු යටතේ ගිණුම්ගත කළ යුතු සියයට 10 රඳවුම් මුදල් රු.63,210 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කිරීම නිසා 2014 දෙසැම්බර් 31 දිනට ණයහිමියන්ගේ වටිනාකම රු.63,210 ක් වැඩියෙන් හා ආපසු ගෙවිය යුතු තැන්පතුවල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ අනිසි ලෙස පවතින කසල යන්ත්‍රයක් මඟින් ඉවත් කිරීමේ කර්මාන්තය සඳහා රු.261,110 ක් සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබූ නමුත් 2014 දෙසැම්බර් 31 දිනට ඒ වෙනුවෙන් රු.261,110 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සැලසීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය හා 2014 දෙසැම්බර් 31 දිනට ණයහිමියන්ගේ වටිනාකම රු.261,110 බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේ දී ඉවත් කරන ලද රු.19,810 ක භාණ්ඩවල වටිනාකම සමුච්චිත අරමුදලට හර කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ වැය විෂයන්ට හර කිරීම නිසා වර්ෂයේ ඌණතාවය හා 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.19,810 බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) දියතලාව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ පළමු අදියර සඳහා සභාව විසින් දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය මුදලට අදාලව 2013 – IV වන කාර්තුව වෙනුවෙන් ගෙවිය යුතු පොලී මුදල රු.193,157 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සැලසීමේදී සමුච්චිත අරමුදල් ගිණුම හරකර ණයහිමි ගිණුම බැරකළ යුතු වුවද වර්ෂයේ වැය ශීර්ෂයකට හරකිරීම නිසා වර්ෂයේ ඌණතාවය එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) දියතලාව වෙළඳ සංකීර්ණයේ දෙවන අදියර ඉදිකිරීම සඳහා සභාව විසින් දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය මුදලට අදාලව 2014 දෙසැම්බර් මාසයට ගෙවිය යුතු රු.70,000 ක පොලී මුදල දෙවරක් ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය හා වර්ෂය අවසානයට ණයහිමි ශේෂය රු.70,000 බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(එ) පසුගිය වර්ෂයට අදාල රු.32,928 ක විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.32,928 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 6,825,984 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.27,808,043 ක් විය.

1.3.3 **නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

---------------------------------------------------

සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලැබූ හා සේවය හැරගිය සේවකයින් 11 දෙනෙකුගෙන් 2007 සිට 2011 වර්ෂය දක්වා කාලය තුල අයවීමට ඇති රු.54,562 සේවක ණය ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති වල විධිවිධාන අනුව අයකරගෙන නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.50,538 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,636,694 ක් විය. ඒ අනුව රු.6,586,156 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 **ආදායම් පරිපාලනය**

---------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ ආදායම රු.2,430,234 ක් වූ අතර වර්ෂය අවසානයට හිඟ ආදායම රු.507,090 ක් වුයෙන් එය බිල්කළ ආදායමින් සියයට 21 ක් විය.

2.2.2 **වරිපනම් බදු**

--------------

සභා බල ප්‍රදේශය තුල පිහිටි වරිපනම් බදු අයකළ හැකි දේපල, 2004 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි.

2.2.3 **බදු කුලී**

--------

පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සභාව සතු කඩ කාමර 39 ක් සඳහා මාසික බදු කුලී, ප්‍රධාන තක්සේරුකරු හෝ පළාත් පාලන ආයතන සම්බන්ධ තක්සේරුකරුවකු මගින් තක්සේරු කරවාගෙන නොතිබුණි.

2.2.4 **වෙනත් ආදායම්**

සභා බල ප්‍රදේශය තුල සන්නිවේදන කුළුණු පවත්වාගෙන යාම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, බල ප්‍රදේශය තුල ස්ථාන 08 ක එම කුළුණු ඉදිකර තිබුණි.

2.2.5 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---:|
| උසාවි දඩ | 511,069 |
| මුද්දර ගාස්තු | 3,151,724 |
| | 3,662,793 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

දියතලාව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම පළමු අදියර සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් 2010 සැප්තැම්බර් 17 දින ලබාගත් රු.6,800,000 ණය මුදල සඳහා 2013 දෙසැම්බර් 30 සිට 2014 දෙසැම්බර් 30 දක්වා කාලය තුල ගෙවිය යුතු එකතුව රු.1,541,690 ක් වූ ණය වාරික 05 ක් 2015 පෙබරවාරි වන විටත් ගෙවා නොතිබුණි.

3.2 **නිෂ්කාර්ය වත්කම්**

සභාව සතු මිට්ෂුබිෂී වර්ගයේ කැබ් රථයක් හා අත්ට්‍රැක්ටරයක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ විධිමත් පරිදි අපහරණය කිරිමට කටයුතු නොකර නිෂ්කාර්යව සභා භූමියේ රඳවා තිබුණි.

4. **පද්ධති හා පාලන**
**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ගබඩා පාලනය